# නිහාල් ප්‍රනාන්දුට ඔබේ සහාය අවශ්‍යයි



ශ්‍රී ලාංකේය ටෙලි නාට්‍යකරණයේ නොමැකෙන චරිත නිරූපණයක නිරත වූ අතළොස්සක් කලා ශිල්පීන් අතරින් නිහාල් ප්‍රනාන්දු නම් වූ රංගවේදියාට, අධ්‍යක්ෂවරයාට, තිර රචකයාට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. කඩවර, අන්තස්වරයෝ, නේරංජනා, තවත් එක් ගැහැනියක්, අඹරාවක්, වංශක්කාරයෝ, බොරදිය කඳුර, තෙත් සහ වියළි, කුලැත්තියෝ ආදී ටෙලි නාට්‍ය රැසක රංගන පෞරුෂයෙන්, නිර්මාණකරණයෙන් සමාජගත කළ මේ නිර්මාණ ශිල්පියා දැඩි සේ අසාධ්‍ය තත්ත්වයට පත් වී ශල්‍යකර්මයකට භාජනය කොට දැන් තම සහෝදරියකගේ නිවසේ විවේකීව කල් ගෙවන බවය.

හදිසි හෘද ශල්‍යකර්ම දෙකකටම මුහුණ දී සිටින නිහාල් ප්‍රනාන්දු ගේ දුරකතන අංකය 0766970632 වෙයි ඔහුට යම් සහයෝගයක් දෙන්නට අවශ්‍ය නම් මේ දුරකතන අංකයට කතා කරන්න.



## කපුගේට හැත්තෑවයි

සදානුස්මරණීය ගායක ගුණදාස කපුලේ මහතා ගේ 70 වන උපන්දිනය අගොස්තු 7 වනදාට යෙදී තිබුණි. ජනතාවාදී කලාකරුවකු ලෙස ජන හද දිනා සිටි කපුගේ ගැයූ ගී අදත් දනන් තුඩ තුඩ රැව් පිළිරැව් දෙයි.

මේ අද්විතීය සංගීතවේදියාගේ 70 වන ජන්ම දිනය නිමිති කරගෙන "කපුගේට හැත්තෑවයි" නමින් ප්‍රසංගයක් සැප්තැම්බර් මස 11 වන දා බණ්ඩාරනායක ගුණානුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වෙයි.

වැඩි සැලකිල්ලකින් ගායනා කරන්න ඕන කියලා හිතනවා."

ප්‍රසංගය අතරතුර දී රසවත් කතා කීමක්, සිය බිරිඳට විහිළු තහළු කරමින් සුහද අන්දමකින් ගී ඉදිරිපත් කිරීමත් සනත් නන්දසිරි ගායන ශිල්පියාණන්ගේ සිරිතක්. ඒ පිළිබඳව මල්කාන්ති නන්දසිරි ශිල්පිනිය සිය අදහස් දැක්වූයේ ඉතා උනන්දුවෙන්.

"අපි දෙන්නාගේ තියෙන්නේ බොහොම සමීපත සම්බන්ධතාවයක්. ඒ නිසා එයා මොනවා කියලා විහිළු කළත් මට ඇතිවෙන්නේ ආදරයක්. හුඟ තදෙනෙක් මගෙන් අහන ප්‍රශ්නයක් ඔය."ඔයාට විහිළු කරනකොට තරහා යන්නෙ නැද්ද ?" කියලා අහනවා හරියටවත් අය. ඒ විහිළුවලින් මම අපහසුතාවයට පත්වෙන්නේ නෑ. අපේ පෞද්ගලික ජීවිතයට හානියක් වෙන්නෙත් නෑ."

සනත් මල්කාන්ති නන්දසිරි ගායක යුවලගේ නිවසේ දුරකථනයට අප සමු දුන්නේ ඔවුන් දෙපල සමගින් "සීත රෑ වසන්තේ " ප්‍රසංගයේ තාල තරංග වාදනය සඳහා එක් වන විශාරද මනෝජ් පීරිස් වාද්‍ය ශිල්පියාණන්ව ඇමතීමේ බලාපොරොත්තුවෙන්. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්‍ෂක මණ්ඩලයේ අධ්‍යක්‍ෂකවරයෙකු වන මනෝජ් පීරිස් සංගීත ශිල්පියාණන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ "රිදම් වැට්", "ලිට්ල් ස්ටාර්", "සංහිඳ" වැනි වැඩසටහන්වල සංගීතය මෙහෙයවමින් රසික ප්‍රේක්‍ෂකයින්ගේ ආදරය නොමඳව ලබයි. අමෙරිකාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ස්විස්ටර්ලන්තය, ඔස්ට්‍රියාව, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව වැනි රටවල් 42ක සංචාරය කර ඇති මනෝජ් මෙහි පැමිණෙන්නේ කලකට පසුවයි.

"ඇත්තට ම 2006 න් පස්සේ මම පිටරට සංචාරවල ගියේ නැත්තේ කාර්යබහුලකම නිසාමයි. අන්තිම වතාවට අමෙරිකාවට ගියේ දීපිකා ප්‍රියදර්ශනීයි, සුනිල් එදිරිසිංහයි එක්ක. ඔය රටවල් අතරින් මගේ විශේෂ ඇලමක් තියෙන රට තමයි ඕස්ට්‍රේලියාව. හරියට හිතවත් අයත් ඉන්නවානේ."

මනෝජ් පීරිස් සංගීත ශිල්පියා සංගීත පවුලක බාලයායි. ඔහුගේ වැඩිමල් සොහොයුරියයි. මල්කාන්ති නන්දසිරි මහත්මිය. නිර්මලා රණතුංග සහ නෙරංජලා සරෝජිනී පීරිස් ශිල්පිනිය අනෙක් සොයුරියන් දෙදෙනායි, නිර්මලා රණතුංග ශිල්පනිය විවාහ වී සිටියේ තවත් ප්‍රවීණ තබ්ලා වාද්‍ය ශිල්පියෙකු වූ දිවංගත විශාරද විජේරත්න රණතුංගයන් සමඟයි. නෙරංජලා සරෝජිනියගේ සැමියා වූයේ දිවංගත අබේවර්ධන බාලසූරිය ගායන ශිල්පියායි. මෙවන් පවුලක බාලයා ලෙසින් පවුලේම සාමාජිකයින් සමඟ කෙරෙනා ඕස්ට්‍රේලියානු සංචාරය කෙලෙස වේදැයි ඔහු හට ?

"පවුලේ උදවිය විතරක් නෙවෙයි, අමරදේව තුමාගේ ඉඳන් හැමෝම එක්ක මම ප්‍රසංගවලට සම්බන්ධ වෙලා තියෙනවා. පවුලේ අයත් එක්ක යන සංචාරවලදී මට දැනෙන්නේ ලෙසර ඉන්නවා වගේමයි. ඒත් සනත් නන්දසිරි මහත්තයා එක්ක කරන සංචාර මට විශේෂයි" එතුමාමගේ ලොකු අයියා වුනාට එතුමා තමයි මගේ එක ම ගුරුතුමා......" මනෝජ් ශිල්පියා පැවසුවේ බොහොම ලෙන්ගතු කමකින්.

"ඒ වගේ ම මාත් එක්ක මුල් ම "රිදම් වැට්" වැඩසටහනේ ඉඳන්ම ඕගන් එක වාදනය කරපු ඉන්ද්‍රජිත් මිරිහාන එක්ක වැඩකට එකතුවෙන එකත් සතුටට කාරණයක්." මනෝජ් පිළිසඳර නිම කළා.

"සිරෙක්ට්ෆොරෙක්ස් " ආයතනය සංවිධානය කරන "සීත රෑ වසන්තේ " ප්‍රසංගයේදී ඔවුන්ව ඔක්තොම්බර් තුන්වනදා හවස " බිසන් සෙන්ටර්"හි දී මුණ ගැසෙමු.








## ෂාරුක්ට සුපිරි රථයක්

බොලිවුඩයේ සිටින සුපිරි තරුව ෂාරුක් ඛාන් පරිහරණය කරන්නට පෙළඹෙන්නේ ද ඔහුගේ තත්ත්වයට සරිලන ගණයේ දේවල්ය. ෂාරුක් නම් සුපිරි බොලිවුඩ් නළුවා වෙනුවෙන්ම නිර්මාණය වූ ඔහුටම සරිලන නවීන තාක්ෂණය පදනම් කරගත් අති සුඛෝපභෝගී වෑන් රථයක් මේ වනවිට DC Design සමාගම නිර්මාණය කර ඇති බව වාර්තා වෙයි.

ඉන්දීය රුපියල් කෝටි 4 ක මුදලක් වැය කර නිෂ්පාදනය කර ත උපරිම සුවපහසුකම් වලින් සපිරුණු මේ රථය නිර්මාණය කිරීමට දින 45 ක් සිට 60 දක්වා වූ කාලයක් ගතව තිබෙනවා. ඉන්දියාවේ තිබෙන හොඳම ඩ්බසළුහ ඩ්බ රථය මෙය බව කියැවෙයි.

අමිතාභ් බච්චන්, සල්මන් ඛාන්, කරීනා කපූර් සහ ආලියා බාට් ආදී බොලිවුඩ් තරු සතුව ද මෙවැනි සුඛෝපභෝගී රථ ඇත.



## සල්මන් ඛාන් හා විවේක් ඔබරෝයි තවමත් විරසකයි

සල්මන් ඛාන් ගේ සහ විවේක් ඔබරෝයි ගේ සීතල යුද්ධය තවමත් දිග ඇදෙමින් පවතින බවයි වාර්තා වෙන්නෙ. මේ ගැටුවේ තවමත තත්වය වන්නේ නිවේක් විසින් මාධ්‍ය සාකච්ඡාවක් කැඳවනු ලැබ අයිෂ්වර්යා හා තමා අතර ඇති සුහදතාව සම්බන්ධයෙන් සල්මන් මන්ට තර්ජනය කළ බව මාධ්‍යයට පැවසීමයි. මේ චෝදනාව සල්මන් විසින් එකහෙළා ප්‍රතික්ෂප කරනු ලැබ ඇති බව වාර්තා වෙයි.

කෙසේ වුව ද දෙදෙනා මුහුණට මුහුණ හමුනොවී සිටින්නට මහත් වෙහෙසක් ගන්නා බවයි මාධ්‍ය වාර්තා තවදුරටත් දක්වන්නෙ.